**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - 2021**

**------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අධිකාරියේ සමාලෝචිත වර්ෂය අවසාන ප්‍රගති වාර්තාව අනුව 2020 වර්ෂයේදී එම්.ටී.නිව් ඩයමන්ඩ් විදේශීය නෞකාව අනතුරට ලක් වීමෙන් සමුද්‍ර පරිසරයට සිදු වූ හානිය වෙනුවෙන් රක්ෂණ සමාගමෙන් අයවිය යුතු මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 18.6 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණ ද එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | MT-New Diamond නෞකාවෙන් මෙරට සමුද්‍ර පරිසරයට සිදු වූ හානිය පිළිබඳව තක්සේරු කිරීම සඳහා පත් කරන ලද විද්වත් කමිටුව (Expert Committee) විසින් සකස් කරන ලද ඇස්තමේන්තු වටිනාකම් ඇතුළත් වාර්තාව නීතිපතිතුමා හරහා අදාළ නෞකාවේ ලංකාවේ නීතිඥ සමාගම වෙත ඉදිරිපත් කර තිබුණ ද මේ දක්වා ඊට අදාළව ප්‍රතිචාර ලැබී නොමැති අතර එම මුදල් අයකර ගැනීමට නඩු විභාගයකින් පසුව හැකියාව ලැබේ. නඩු තීන්දුව ලැබීමෙන් පසුව පරිසර හානිය සඳහා ලැබිය යුතු මුදල් ගිණුම්ගත කිරීමට කටයුතු කෙරේ. | ආයතනය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් සඳහා විනිවිදභාවයෙන් යුක්තව සිවිල් වගකීම අවසන් ගිණුම්වලින් හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 අප්‍රේල් 27 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ බැංකුවට බැර වී තිබුණු රු.704,396 ක් හඳුනාගෙන ගිණුම් ගැලපීමට කටයුතු නොකර හඳුනා නොගත් ශේෂයක් වශයෙන් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | අදාළ තැන්පතු කළ පුද්ගලයන් මෙතෙක් හඳුනාගෙන නොමැත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන 2022 වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කෙරේ. | බැංකුවට සෘජුව බැර වන මුදල් හඳුනාගෙන නිවැරදිව ගිණුම් ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අධිකාරිය සතු පරමාණුක අවශෝෂණ දීප්තමානය අළුත්වැඩියා කිරීම සඳහා 2019 දෙසැම්බර් 26 දින දරන ලද පුනරාවර්ථන වියදම රු.1,215,299 ක් ප්‍රාග්ධනිත කර වාර්ෂිකව ක්ෂය කරමින් තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් පිරිවැය රු.1,215,299ක්, සමුච්චිත ක්ෂය රු.364,589 ක් හා ක්ෂය වියදම රු.121,529ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අළුත්වැඩියා වියදම නිවැරදිව ගිණුම් ගැලපීමට කටයුතු කළ යුතුය. |

## 1.5.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අපද්‍රව්‍ය සේවා ප්‍රතිග්‍රහන පහසුකම් සඳහා වරායන් තුළ සේවා නියුක්ත කර ඇති නිලධාරීන් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන දිනකට රු.750 ක් බැගින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතුව රු.19,515,500 ක දීමනාවක් ගෙවා තිබුණි. මෙම ගෙවීමට අදාළව මූලික විමර්ෂණයක් සිදු කරන ලෙස 2021 දෙසැම්බර් 28 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කර තිබුණ ද 2023 පෙබරවාරි 14 දින දක්වාම එවැනි විමර්ෂණයක් සිදුකර වගකිවයුතු පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරියේ විගණන කමිටුව මගින් ලබාදුන් උපදෙස් මත මූලික විමර්ශනයක් සිදුකිරීම සඳහා දැනටමත් රේඛීය අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. | විමර්ශනයක් සිදුකර වගකිවයුතු පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනතේ 14 වගන්තිය | 2021 වර්ෂය සඳහා සමුද්‍රීය පරිසර සභාවක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | පනතට අනුව පරිසර සභාවේ සාමාජිකයන් අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන නමුත් පසුගිය වසර තුනක කාලය තුළ වරින්වර අධිකාරිය රේඛීය අමාත්‍යාංශ හතරකට අයත් වූ බැවින් පරිසර සභාවේ සාමාජිකයන් පත්කිරීමට නොහැකි විය. මේ වන විට පරිසර සභාව නම් කර ඇති අතර ඉදිරියේදී පරිසර සභාවට සාමාජිකයන් පත්කර කමිටුව රැස්කිරීමට කටයුතු කරනු ලැබේ. | පරිසර සභාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | i. මුදල් රෙගුලාසි 135 | වටිනාකම රු.412,089 ක් වූ අතිකාල වවුචර් 33ක් කළමනාකාර සහකාර (පරිපාලන) ගේ අනුමැතිය මත ගෙවා තිබුණි. | MV XPress Pearl නෞකාවේ රාජකාරී කටයුතු සිදු කරනු ලැබූ නිළධාරීන් සඳහා විශේෂ අතිකාල ගෙවීමට සාමාන්‍යාධිකාරීගේ/සභාපතිගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව සහකාර කළමනාකරු (පාලන) විසින් ගෙවීම් අනුමැතිය ලබා දී ඇත. | මූල්‍ය පාලන බලතල ඉක්මවා කටයුතු කරන නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | ii. මුදල් රෙගුලාසි136 | වියදම්වලට බැඳීමට බලය ලබාදීමකින් තොරව අවස්ථා 17 කදී නිලධාරීන්ගේ රෝහල් ගාස්තු රු.3,283,838 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි. | MV XPress Pearl නෞකාවේ මෙහෙයුම් කටයුතු සම්බන්ධ රාජකාරී සිදුකිරීමේදී කොවිඩ් රෝගය වැළඳුණු නිලධාරීන් රෝහල්ගත කිරීම නිසා දැරීමට සිදු වූ මෙම වියදම් නෞකාවේ රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය සඳහා ඉදිරිපත් කර ඇත. | බලය ලබා දී නොමැති වියදම් සිදුකර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. මුදල් රෙගුලාසි 138 (8) හා මුදල් රෙගුලාසි 139 (4) | 2021 හා 2022 වර්ෂවල අවස්ථා 43 කදී අධිකාරියේ නිලධාරීන්ට නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් කුවිතාන්සි ලබා නොගෙන හෝටල් 07 කට රු.13,891,140 ක් ගෙවා තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හා ප්‍රවාහන පහසුකම් සැපයීම දුෂ්කර වීම හේතුවෙන් වෙරළ පිරිසිදු කිරීමේ කටයුතු කළ නිලධාරීන් සඳහා සේවා අවශ්‍යතාවය මත අවට පිහිටි හෝටල්වලින් නවාතැන් පහසුකම් ලබා දෙන ලදි. මෙම වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා නෞකාවේ රක්ෂණ ආයතනය වෙත ඉදිරිපත් කර ඇත. | සියලුම ගෙවීම් කුවිතාන්සි මඟින් සනාථ විය යුතුය. |
| iv. මුදල් රෙගුලාසි 138 | වවුචරය නිවැරදි හා සෑම අතින්ම සම්පූර්ණ බවට සහතික කිරීමේ නිලධාරියා විසින් සහතික කර ගෙවිය යුතු වුවද ගෙවීම් වවුචර් 03 ක් නිර්දේශ නොකර ද, වවුචර් 04ක් පිළියෙල කරන ලද හා පරීක්ෂා කරන ලද නිලධාරීන්ගේ අත්සන් නොමැතිව ද, වවුචර් 07 ක ගොනු සම්බන්ධය නොදක්වා ද, වවුචර් 03ක ගෙවූ වටිනාකම් අකුරෙන් සඳහන් නොකර ද, වවුචර් 10 ක කුවිතාන්සි පිළිගත හැකි මට්ටමක නොතිබිය දී ද එකතුව රු.9,102,629 ක් ගෙවා තිබුණු බවට නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මින් ඉදිරියට එවැනි අඩුපාඩු සිදුනොවීමට අවශ්‍ය පියවර ගෙන ඇත. කුවිතාන්සි පිළිගත හැකි මට්ටමක නොවීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය විසින් විශේෂ පරීක්ෂණයක් සිදු කරන අතර වරදක් සිදු වී ඇත්නම් ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවල දක්වා ඇති පරිදි කටයුතු කෙරෙන බව දන්වමි. | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අදාල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| v. මුදල් රෙගුලාසි 156 (2) | MV XPress Pearl විදේශීය නෞකාවේ අනතුර හේතුවෙන් 2021 ජුනි මස 08 සිට දෙසැම්බර් 31 දින | කොවිඩ් වසංගත තත්ත්වය මත ඇති වූ ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් සේවා අවශ්‍යතාවය මත නිළධාරීන්ට ප්‍රවාහන පහසුකම් ලබාදෙන ලදි . | ප්‍රවාහන පහසුකම් සැපයීම රෙගුලාසිවලට අනුකූලව විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දක්වා දින 140 ක කාලයක් සඳහා වාචික අධිකාරි බලය මත පුත්තලම සමුද්‍රීය පරිසර නිලධාරිට සහ කළමනාකාර සහකාරවරයෙකුට රු.834,000 ක වියදමකින් ප්‍රවාහන පහසුකම් ලබා දී තිබුණි. | | |
| vi. මුදල් රෙගුලාසි 264 | 2021 හා 2022 වර්ෂවලදී වවුචර් 53 කින් ගෙවූ රු.27,850,447 ක හෝටල් බිල්පත් සඳහා ගෙවීම් ලාභීන්ගෙන් කුවිතාන්සි ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී ගෙවීම් කටයුතු අවසන් කිරීමෙන් පසුව අදාළ ආයතනවලින් රිසිට්පතක් ලබාගැනීම සහ වවුචරයක් අත්සන් කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | සියලුම ගෙවීම් කුවිතාන්සි මඟින් සනාථ විය යුතුය. |
| vii. මුදල් රෙගුලාසි 237 (අ) (ii) | නිලධාරීන්ට නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් හෝටල් කාමර 169 ක් සඳහා රු.1,051,500 ක් ගෙවා තිබුණු නමුත් නවාතැන් ගත් නිලධාරීන් හා සිදු කළ කාර්යයන් සනාථ නොවුණි. | රටේ පැවති කොවිඞ් වසංගත තත්ත්වය මත MV XPress Pearl නෞකාවේ මෙහෙයුම් කටයුතු සිදුකළ නිලධාරීන් හට නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් දරා ඇති මෙම වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා රක්ෂණ සමාගම වෙත ඉදිරිපත් කර ඇත. | නවාතැන් ගැනීමේ අවශ්‍යතාවය හා සිදු කර ඇති කාර්යයන් සනාථ විය යුතුය. |
| viii. මු.රෙ. 625 (අ) හා (ආ) | ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍ර ප්ලාස්ටික් විශ්ලේෂණය සඳහා වූ මූලික පහසුකම් සැලසීමට එක්සත් රාජධානියේ පාරිසරික, ධීවර හා ජලජීවී විද්‍යා මධ්‍යස්ථානය (Centre for environment, Fisheries & Aquatic Science- CEFAS) | MV X-Press Pearl නෞකාවේ රාජකාරී කටයුතු නිසා මෙම තොරතුරු අවශ්‍ය ගිණුම් වල ගැලපීම සිදුකර නොමැත. නියමිත පරිදි වත්කම් වල අගය ගණනය කිරීමෙන් පසු අදාළ වටිනාකම් 2022 වර්ෂයේ අවසාන ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කෙරේ. | වත්කම් ලේඛන ගතකර කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මගින් සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරිය වෙත ලබා දී ඇති පවුම් 9,391.39 (රු.2,610,806)ක් වටිනා උපකරණ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලේඛනගත කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9(1)(ආ) | විශේෂිත කාර්යයන් සඳහා මාණ්ඩලික පන්තියේ නිලධාරීන්ට එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයකට යටත්ව තත්කාර්යය අතුරු අග්‍රිම ලබා දිය යුතු වුවත් මාණ්ඩලික නිලධාරීන් 05 දෙනෙකු සඳහා අවස්ථා 20 කදී රු.109,600 ක සිට රු.1,000,000 ක් දක්වා වන වටිනාකම්වලින් තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. | ප්‍රාදේශීය කාර්යාලවල වැඩසටහන් සඳහාත්, MV X-Press Pearl නෞකාවේ මෙහෙයුම් කටයුතු සඳහාත් පැවති වාතාවරණය අනුව කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සීමාව ඉක්මවා අවශ්‍ය අවස්ථාවලදී අත්තිකාරම් ලබාගැනීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | අත්තිකාරම් ලබාදීම චක්‍රලේඛ සීමාවන්ට යටත්ව සිදුවිය යුතු අතර සීමා ඉක්මවා කටයුතු කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයෙන් විමසිය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 98,304,624 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.50,000,017 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.148,304,641 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ආදායම රු.174,706,049 කින් ඉහළ ගොස් තිබුණ ද, පෙර වර්ෂයේ රු.214,089,055 ක් වූ මුළු වියදම සමාලෝචිත වර්ෂයේදී රු.537,099,745ක් දක්වා සියයට 150 කින් ඉහළ යාම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| XPress Pearl නෞකාවට අදාළව රැස් කරන ලද අපද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වත්තල තාවකාලික අංගනයේ සිට පමුණුගම ගබඩා අංගනය වෙත ප්‍රවාහනය කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් කන්ටේනර් 40 ක් සඳහා රැඳවුම් ගාස්තු ලෙස රු.17,934,000ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | නෞකාවේ අනතුරත් සමඟ මුල් අවස්ථාවේ සමුද්‍රීය කලාපයට එකතු වූ අපද්‍රව්‍ය මෙම කන්ටේනර් තුළ ගබඩා කර තිබූ අතර මෙම අපද්‍රව්‍ය උපද්‍රවකාරී සාම්පල් CEFAS රසායනාගාරයෙන් පරීක්ෂා කිරීමෙන් පසුව ඔක්තෝබර් මස වත්තල සිට පමුණුගමට ප්‍රවාහනය කිරීම ආරම්භ කිරීම අනුව මෙම ගාස්තු ගෙවීම සිදුකළ යුතු වූ අතර මෙම ගාස්තුවලින් කොටසක් මේ වන විටත් රක්ෂණ ආයතනය විසින් භාණ්ඩාගාරයට ගෙවා ඇත. ඉතිරි මුදල් ගෙවීම සඳහා එකඟතාවය පළකර ඇත. | ප්‍රමාදයන් අවම වන පරිදි කටයුතු කළ යුතු අතර රක්ෂණ සමාගමෙන් සියළුම මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හදිසි රසායන ද්‍රව්‍ය විසිරීමකදී ජාතික මට්ටමින් ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ සැලැස්මක් සකස් කර නොතිබුණි. ඒ හේතුවෙන් එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුරේදී රසායනික ද්‍රව්‍ය විසිරීමෙන් සිදු වූ හානිය මනා අයුරින් කළමනාකරණය කළ බවට සනාථ කළ නොහැකි විය. | ශ්‍රී ලංකා ජල තීරයේ සිදුවූ රසායනික ද්‍රව්‍ය විසිරීමේ අනතුරු, ඉදිරියේදි සිදුවිය හැකි අනතුරු වල අවදානම, රසායනික ද්‍රව්‍ය විසිරීමට අදාල ජාත්‍යන්තර ප්‍රඥප්තිවලට එකඟතාවය පලකිරීම යන කාරණා අරමුණු කොට ගෙන ජාතික තෙල් විසිරීයාමේ හදිසි සැලැස්ම උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය විසිරීම ඒකාබද්ධ කොට යාවත්කාලීන කිරීමේ කටයුතු මෙම අධිකාරිය මට්ටමින් සිදු කෙරෙමින් පවතී. තවද, එම ජාතික සැලැස්ම අදාළ පාර්ශව, ආයතන හා විශේෂඥ කණ්ඩායම් සමඟ වැඩමුළු පවත්වා තවදුරටත් වැඩි දියුණු කර කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමටත්, සමුද්‍ර දූෂණ පනත සංශෝධනයේදී රසායනික ද්‍රව්‍ය විසිරීමට අදාළ නීතිමය ප්‍රතිපාදන ඇතුළත් කිරීමටත් සිදු බලාපොරොත්තු වේ. | ජාතික මට්ටමින් ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කැබිනට් මණ්ඩල අනුමැතියක් මත 2018 වර්ෂයේ සිට ධීවර වරායවල් ඇතුළුව වෙරළ කලාපය තුළ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ වැඩසටහන යටතේ පළාත් පාලන ආයතන 84 ක අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු ස්ථාපිත කර තිබුණ ද එම කමිටු නිසි පරිදි රැස් වී නොතිබීම හා කාර්යක්ෂමව ක්‍රියාත්මක වී නොතිබීම හේතුවෙන් ඒවායින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණු අතර ධීවර වරායවල් ආශ්‍රිතව බහුලව පවතින Fiber අපද්‍රව්‍ය පිළිබඳ විසඳුමක් ලබා දීමට ද අධිකාරියට නොහැකි වී තිබුණි. | පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ කමිටු පිහිටුවීම ප්‍රමාද වී ඇත. මේ වන විට කමිටු පිහිටුවා ක්ෂේත්‍ර චාරිකා/ නිරීක්ෂණ හා රැස්වීම් ආදිය පවත්වා ගෙන යනු ලැබේ. ධීවර වාරායන් ආශ්‍රිත ෆයිබර් අපද්‍රව්‍ය වලට ලංකාවේ ඇති විසඳුම වන්නේ ෆයිබර් ග්ලාස් incinirate තුළ දහනය කිරීම වන නමුත් ඒ සඳහා ඇති එකම ස්ථානය වන පුත්තලමේ Incee Cement සමාගම වන අතර, ඒ සඳහා අධික පිරිවැයක් වැයවනු ලබයි. එම පිරිවැය ධීවර වරාය නිතිගත සංස්ථාවට දැරීමේ හැකියාවක් නොමැති අතර අප අධිකාරිය මේ පිළිබඳව විසඳුම් සෙවීම දිගටම සිදු කර ගෙන යනු ලබයි. | අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවල කටයුතු කාර්යක්ෂම කිරීමටත්, ධීවර වරායවල් ආශ්‍රිතව බහුලව පවතින Fiber අපද්‍රව්‍ය පිළිබඳ විසඳුමක් ලබා දීමටත් අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනතේ 34 (අ) වගන්තිය අනුව සිවිල් වගකීම යටතේ 2021 මැයි මස 21 දින එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුරෙන් සිදු වූ සමුද්‍ර දූෂණයට අදාළව ආයතනය විසින් 2023 ජනවාරි 09 දින සකස් කර ඇති දෙවන අන්තර්කාලීන වාර්තාව අනුව තක්සේරු කර ඇති පාරිසරික හානිය ඇ.ඩොලර් 6,483,416,430 ක් අදාළ නෞකා සමාගමෙන් අයකර ගැනීම සඳහා 2023 මැයි 20 දිනට පෙර නඩු පැවරීම සිදු කළ යුතු අතර එසේ නැතහොත් සිවිල් නීතිය යටතේ කාලාවරෝධයට යටත් වන බවට නිරීක්ෂණය විය. එසේ වුවද, විගණිත දිනය වූ 2023 පෙබරවාරි 15 දින දක්වාම එම නඩු පැවරීම සිදු කර නොතිබුණි. | පනතේ 34 වන වගන්තිය වන සිවිල් වගකීම යටතේ අනතුරෙන් වෙරළ දූෂණයක් සිදු වූ ප්‍රදේශ පිරිසිදු කිරීම, ආර්ථික ක්‍රියාකාරකම් වලට වූ හානිය, දේපළ වලට වූ හානිය, පරිසරය යථා තත්ත්වයට පත් කිරීම සඳහා යන වියදම, පරිසර දූෂණය පසුවිපරම් කිරීම සඳහා යන වියදම් ආදිය නෞකාව අයිතිකරුගෙන් හෝ රක්ෂණ සමාගම මඟින් අයකර ගැනීමට පුළුවන. මෙම නෞකා අනතුර මඟින් සිදු වූ පරිසර හානි ඇගයීම සඳහා පත්කරන ලද විද්වත් කමිටුව විසින් පිළියෙල කොට ඇති අතුරු වාර්තා (1) හා (2) අවශ්‍ය කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති අතර අනතුර සිදුවීමෙන් | කාලාවරෝධයට යටත් වීමට පෙර සිවිල් වගකීම යටතේ නඩු පවරා අදාළ වන්දි මුදල් අයකර ගැනීමටත්, දරා ඇති හා අදාළ වන වියදම් රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමටත් කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තවද, පනතේ 34 (ආ) වගන්තිය යටතේ මෙම නෞකා අනතුරට අදාළව ශ්‍රී ලංකා රජය විසින් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය සඳහා 2023 පෙබරවාරි 15 දින දක්වා ඉදිරිපත් කර ඇති මුළු වටිනාකම ඇ.ඩො.මිලියන 44.528 ක් වූ අතර එයින් මේ වන විට ලැබී ඇති මුදල ඇ.ඩො. මිලියන 6.725 ක් පමණක් විය. තව දුරටත් ඇ.ඩො. මිලියන 5.989 ක මුදලක් ලැබිය යුතු බවත්, ඉතිරිය ඇස්මේන්තුගත වියදම් වන බැවින් රක්ෂණ සමාගම විසින් ප්‍රතික්ෂේප කර ඇති බවත් විගණනය වෙත කරුණු ඉදිරිපත් කර තිබුණි. | පසුව අවුරුදු 2 ක කාලසීමාවක් තුළ සිවිල් නඩුකරය පැවරිය යුතුය. ගිලුණු නෞකාව තවමත් ගිලුණු තැනම පවතින බැවින් හා පරිසර දූෂණය තවමත් සිදු වන බැවින් මේ සම්බන්ධයෙන් අවසන් වාර්තාවක් සකස් කළ නොහැක. | |
| (ආ) | පනතේ 26 වගන්තිය යටතේ MV X Press Pearl නෞකා අනතුරට අදාළව අධිකාරිය විසින් අපරාධ වගකීම යටතේ නඩු පවරා තිබුණ ද 2023 ජනවාරි 03 දින දක්වාම ඊට අදාළ තීන්දුව ලබාදී නොතිබුණි. | මෙම අනතුර සිදු වූ පසු පනත ප්‍රකාරව අධිකාරිය මඟින් පමුණුගම පොලීසියට පැමිණිල්ලක් ඉදිරිපත් කර අදාළ සියලු තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. එසේම පනත අනුව අනතුර පිළිබඳ විමර්ශනය සඳහා පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බලතල පවරා විමර්ශන කටයුතු සිදු කිරීමට උපදෙස් දී ඇත. එහෙත් නීතිපති දෙපාර්තමේන්තුව මඟින් අදාළ වග උත්තරකරුවන් වෙත අධිචෝදනා ගොනුකරනු ලැබුයේ අනතුර සිදුවීමෙන් මාස 11 කට පමණ පසුවය. මේ වන විට එම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී. | නඩුව හැකි ඉක්මණින් වාසි සහගතව අවසන් කර ගැනීම සඳහා අවශ්‍ය මෙහෙය වීම් හා සහාය වීම් සිදු කළ යුතුය. |
| (ඇ) | විදේශීය නෞකා (X-press pearl) අනතුර හේතුවෙන් සිදු වූ පරිසර හානි තක්සේරුකරණයට අදාළව සාම්පල් පරීක්ෂා කිරීම වෙනුවෙන් විදේශීය විද්‍යාගාරවලට ගෙවන ලද රු.3,332,910 ක් පියවා ගැනීම සඳහා නෞකා රක්ෂණ ආයතනයෙන් ඇ.ඩො. 554,045 ක් හා ඇ.ඩො. 470,614 ක් වශයෙන් අවස්ථා | රසායනාගර පරීක්ෂණ සඳහා දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම අදාළ පරීක්ෂණ දත්ත ලබාදෙන තෙක් රක්ෂණායතනය විසින් ප්‍රමාද කර ඇත.රසායනාගාර දත්ත හා වාර්තා නෛතික හේතූන් මත රක්ෂණායතනය වෙත ලබාදීම සිදුනොකරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව විසින් | වැය කර ඇති මුදල් නෞකා රක්ෂණ ආයතනයෙන් ලබා ගැනීමට අදාළ කටයුතු කඩිනම් කළ යුතුය. |

| | |
|---|---|
| දෙකකදී ප්‍රතිපූර්ණයන් ඉල්ලා තිබුණ ද එම ගෙවීම් රක්ෂණ සමාගමෙන් පිළිගෙන නොතිබීමෙන් එම මුදල් ලබා ගැනීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. | අධිකාරිය වෙත දන්වා ඇත. එසේ ලබාදීම සිදුනොකළහොත් සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 34 වන වගන්තිය අනුව මෙම වියදම් අයකරගැනීමේ හැකියාව අධිකාරියට පවතී. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් සමුද්‍රීය පරිසර පද්ධතිය සංරක්ෂණය, ප්‍රතිස්ථාපනය හා වැඩිදියුණු කර ආයතන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති 09 ක් හඳුනාගෙන තිබුණු අතර එම ප්‍රතිපත්තිවලට ලඟා වීම සඳහා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙන් ව්‍යාපෘති 15 ක් යටතේ වටිනාකම රු.6,665,000ක් වූ කාර්යයන් 38ක් සැලසුම් කර තිබුණි. එසේ වුවද, එයින් කාර්යයන් 11 ක් ඉටු කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණු අතර කාර්යයන් 08 ක ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක විය. | මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, ලැබිය යුතු ප්‍රතිපාදන සීමා කිරීම, වෙළඳපොලේ පවතින මිල ගණන් ඉහළ යාම, කොවිඩ් - 19 ව්‍යාප්තවීමේ වැඩිවීම මත ජනතාව එක්රැස් කිරීමේ දුෂ්කරතාවයන් වැනි අධිකාරියට පාලනය කිරීමට නොහැකි හේතූන් මත ඉලක්කගත කාර්සාධනයට ලඟාවීමට නොහැකි වූ පෙන්වා දෙමි. | ක්‍රියාකාරී සැලැස්ම කාලීනව සමාලෝචනය කරමින් අධිකාරියේ කාර්භාරය ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| X Press Pearl නෞකාවේ අනතුර මඟින් වෙරළ තීරයට සිදු වූ හානියට අදාළ පිරිසිදු කිරීම් කටයුතු සඳහා සහභාගී වන පිරිසට නවාතැන් පහසුකම් හා සේවා පහසුකම් සැපයීම සඳහා සරක්කුකන්ද ප්‍රදේශයේ පරිශ්‍රයක් 2021මැයි මස 29 දින සිට ලිඛිත ගිවිසුමකින් තොරව කුලියට ගෙන දෛනිකව රු.5,500 ක් | මෙම සමුද්‍රීය දූෂණය දැඩි ලෙස සිදු වූ මීගමුව කලපුව ආශ්‍රිත පමුණුගම ප්‍රදේශයේ සරක්කුකන්ද වෙරළ කලාපයේ ප්ලාස්ටික් ඇට ඉවත්කිරීමේ කටයුතු සිදුකිරීම සඳහා කැඳවූ අධිකාරියේ දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල වල නිලධාරීන්ට නවාතැන් ගැනීමට සහ උපකරණ වල ආරක්ෂාවට | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| බැගින් 2021දෙසැම්බර් 31 දින දක්වා රු.1,193,500 ක් ගෙවා තිබුණි. | මෙම හෝටලය දෛනික කුලී පදනම මත ලබා ගන්නා ලදී. |

## 4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය සඳහා අධිකාරියේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වාර්ෂික වාර්තාව සකස්කර අවසන් කර ඇත. | වාර්ෂික වාර්තාව නියම කර ඇති කාල වකවානු ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් 2017 වර්ෂයේ සැලසුම් කරන ලද තිරසර සංවර්ධන ඉලක්ක අතරින් 2025 වර්ෂය වන විට ප්‍රතිස්ථාපනය කිරීමට අපේක්ෂිත කොරල්පර 6,000 $m^2$ කින් 1,500$m^2$ක් පමණක් ප්‍රතිස්ථාපනය කර තිබීමත්, නව සමුද්‍රීය පරිසර ආරක්ෂණ ප්‍රදේශ 04 ක් හඳුනාගැනීම යටතේ ප්‍රගතිය 01 ක් පමණක් වීමත්, 2030 වන විට සමුද්‍රීය පරිසරයට අදාළ අන්තර්ජාතික සම්මුතීන්වලට අනුගත වීම යටතේ හඳුනාගන්නා ලද සම්මුතීන් 06ක් අපරානුමත කර නොතිබීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඒවායේ ප්‍රගතිය පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂය වන විට 1300 $m^2$ ක ප්‍රමාණයක කොරල් ස්ථාපිත කර ඇත. කෙසේ නමුත් මෙම ඉලක්කයන් සපුරාගැනීම මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන සහ අවශ්‍ය අමුද්‍රව්‍යවල සැපයුම මත තීරණය වන බව පෙන්වා දෙමි. | 2025 වර්ෂයේදී ඉලක්කය සපුරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |